# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,482 - 2026 මාර්තු මස 27 සිකුරාදා - 2026.03.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... | 402 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් | |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 අප්‍රේල් මස 17 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 අප්‍රේල් මස 02 වැනි දින දහවල් 12. 00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 ජනවාරි මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


401 - B 082778— - (2026/03)
F 1 -

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

## වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී (එක් අවුරුදු පුහුණු ශ්‍රේණිය) තනතුරු සඳහා ස්ථිර පදනමින් නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා වයඹ පළාතේ ස්ථිර පදිංචි සුදුසුකම්ලත් ස්ත්‍රී / පුරුෂ දෙපාර්ශ්වයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2026 මැයි මස කුරුණෑගල නගරයේ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කෙරේ. මෙම විභාගය කල්දැමීමට හෝ අවලංගු කිරීමට වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

01. **අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් :-** ඉහත සඳහන් තනතුර සඳහා,

(අ) *අධ්‍යාපන සුදුසුකම් :*

භෞතික විද්‍යාව හා ගණිතය යන විෂයයන් සහිතව ගණිතය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අ.පො.ස. (උසස් පෙළ) විභාගය එකවර සමත් වීම ;

*හෝ*

තාක්ෂණවේදය විෂයය ධාරාවේ ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණය සඳහා විද්‍යාව ඇතුළුව විෂයයන් තුනකින් අ.පො.ස. (උසස් පෙළ) විභාගය එකවර සමත් වීම ;

*සහ*

සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

*සැ.යු.- ඉහත අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ද සම්පූර්ණ කර තිබිය යුතුය.*

(ආ) *වෘත්තීය සුදුසුකම් :*

| *තනතුරු නාමය* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|
| සැලසුම් ශිල්පී<br>(එක් අවුරුදු පුහුණු ශ්‍රේණිය) | I. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳව එක් අවුරුදු පූර්ණකාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.<br>**හෝ**<br>II. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |

*සැ.යු. ඉහත සඳහන් සියලු අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් 2026.04.27 දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර සහතික ලබා තිබිය යුතුය.*

02. **වෙනත් සුදුසුකම් :**

2.1 අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු අතර විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

2.2 සෑම අපේක්ෂකයෙකුම වයඹ පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි විය යුතුය.

2.3 අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන විට වයඹ පළාත තුළ පූර්වාසන්න වසර 03 ක කාලයක්වත් ස්ථිර පදිංචිව සිටි අයෙකු බවට ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකයක් (DS 04 ග්‍රාම නිලධාරි සහතිකය) මඟින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී සිය පදිංචිය සනාථ කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට වයඹ පළාතේ ස්ථිර පදිංචිය පූර්වාසන්න වසර 03 කට වඩා අඩු අයදුම්කරුවන් ද තමන් පදිංචි කාල සීමාව DS 04 ග්‍රාම නිලධාරි සහතිකය මඟින් තහවුරු කළ යුතුය.

2.4 අයදුම්කරු වයඹ පළාතේ ස්ථිර පදිංචිය ලබා තිබුණ ද අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට වයඹ පළාතේ ස්ථිර පදිංචිය පූර්වාසන්න වසර 03 කට වඩා අඩුවන අවස්ථාවක දී, අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වනවිට අයදුම්කරුගේ කලත්‍රයා හට වයඹ පළාතේ පූර්වාසන්න වසර 03 ක කාලයක්වත් ස්ථිර පදිංචිය තිබේ නම් එවැනි අයදුම්කරුවන් පිළිබඳව ද ඉහත 2.3 වගන්තිය ප්‍රකාරව සලකා බැලේ. කලත්‍රයාගේ සහ අයදුම්කරුගේ පදිංචි සහතික (DS 04 සහතික) හා විවාහ සහතිකය සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුය.

2.5 අදාළ තනතුර සඳහා බඳවාගනු ලැබුවහොත් අවම වශයෙන් වසර 10 ක් වයඹ පළාත තුළ සේවය කළ යුතු වේ.

2.6 2026.04.27 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 40 ට නොවැඩි විය යුතුය.

2.7 තනතුරට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

*සංලක්ෂය :- ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.*

03. **වැටුප් පරිමාණය :-**

රා.ප.ච. 10/2025 හි උපලේඛන අංක. VI අනුව පුහුණු කිරීමේ ශ්‍රේණියට අදාළව මාසික දීමනාව රු. 41,317.00 කින් ආරම්භ වී ඉදිරියට ගෙවීම් කරනු ලබන අතර පුහුණු කාලය අවසන් කර III වන ශ්‍රේණියට පත්වීම් ලද පසු 2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I හි MN 3 – 2025 අනුව,

**රු. 52,250 - 10x 800 - 11 x 1190 - 10 x 1320 - 10 x 1350 - රු.100,040/- වේ.**

(2027.01.01 දක්වා එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන III හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.)

04. **සේවා කොන්දේසි:**

4.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තවද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

4.2 මෙම තනතුරට පත් කරනු ලබන්නන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, පරිවාස කාලය තුළ සිය තනතුරේ රාජකාරී වැඩ සහ හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවෙනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්ව තිබේ නම් හා සේවය ස්ථිර කිරීම සඳහා වන අනෙකුත් අවශ්‍යතාවන් සම්පූර්ණ කර තිබේ නම් පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කරනු ලැබේ.

4.3 රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළදී ලබා ගත යුතුය.

4.4 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට ආනුෂාංගික චක්‍රලේඛ අනුව සේවයට බැඳී වසර 03 ක් ඇතුළත සේවයට බැඳුණු භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙකුත් රාජ්‍ය භාෂාව / භාෂා පිළිබඳ ප්‍රවීණතාවය නියමිත මට්ටමට ලබා ගත යුතුය.

4.5 III වන ශ්‍රේණියේ වසර 05 ක් ඉක්මවීමට පෙර ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අ.පො.ස. (සා/පෙළ) සම්මාන මට්ටමේ ප්‍රවීණතාවයක් ලබා ගත යුතුය.

4.6 මෙම තනතුර සඳහා වන බඳවා ගැනීමේ / උසස් කිරීමේ පරිපාටියේ රෙගුලාසි හා ඒ අනුව පැවරෙන කාර්යභාරයට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද වයඹ පළාත් කාර්ය පටිපාටික රීති, වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහයට හා විනය කාර්යය සංග්‍රහයට ද දෙපාර්තමේන්තු නියෝගවලට ද වයඹ පළාත් සභා තාක්ෂණ සේවයට අයත් කාර්මික නිලධාරී / සැලසුම් ශිල්පී තනතුරු සඳහා වන සේවා ව්‍යවස්ථාවට ද රාජ්‍යය හා වයඹ පළාත් සභාව විසින් නිකුත් කර ඇති හා වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසිවලට හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම නිලධාරීන් බැඳී සිටී.

05. **බඳවා ගැනීමේ ක්‍රමය:-**

5.1 ලිඛිත තරග විභාගයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. විභාග විෂයය නිර්දේශයේ දැක්වෙන එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබා ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව ප්‍රමුඛතා ලේඛනයක් සකස් කරනු ලැබේ. ප්‍රමුඛතා ලේඛනයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ. අදාළ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ඇති අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු වූ විට ලිඛිත විභාගයකින් තොරව සම්මුඛ පරීක්ෂණයකින් පමණක් බඳවා ගනු ලැබේ.

5.2 සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමක් සිදු නොකරන අතර අධ්‍යාපන, වෘත්තීය ඇතුළු මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා ශාරීරික යෝග්‍යතාව පරීක්ෂා කර බැලීම සිදු කරනු ලැබේ.

5.3 එක් අවුරුදු පුහුණු කාල සීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විභාගය සමත් වීමෙන් පසු III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

***සටහන : ඉහත පුහුණු කාල සීමාව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත්වීමට අපොහොසත් වන ආධුනිකයන් වෙතොත් ඔවුනට මාස 06 කට නො වැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගයෙන් අසමත් වන ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ලැබේ.***

06. **ලිඛිත විභාගය :**

6.1 ලිඛිත විභාගයට සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයකින් ඉල්ලුම් කළ හැකි අතර ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

6.2 මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. සවිස්තරාත්මක විභාග විෂයය නිර්දේශයන් පහතින් දක්වා ඇත :

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් වීම සඳහා ලබා ගත යුතු ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 03 | 100 | 40% |

**විභාග විෂයය නිර්දේශය :-**

(01) බුද්ධි පරීක්ෂණය :

අයදුම්කරුගේ භාෂා හැකියාව, ගණිතමය කුසලතාවය සහ තර්කන ශක්තිය මැන බැලීම සඳහා සකස් කරනු ලබන කෙටි හා බහුවරණ ශෛලියේ ප්‍රශ්න වලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

(02) විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය :

ගොඩනැගිලි නිර්මාණ ශිල්පය පිළිබඳ දැනුම, ප්‍රමාණයට අනුව ඇඳීම, සැලැස්මක් හෝ දළ සටහනක් තේරුම් ගැනීමේ හැකියාව, ව්‍යුහගත නිර්මාණයන් පිළිබඳ මූලික දැනුම, සමීක්ෂණ පිළිබඳ දැනුම, ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කරන ප්‍රශ්න ඇතුළත් වනු ඇත.

07. **විභාග ගාස්තු :-**

විභාග ගාස්තු වශයෙන් රු.1,200/- ක මුදලක් වයඹ පළාත් සභාවේ අංක 2003-02-13 දරන ආදායම් ශීර්ෂයට බැරවන පරිදි වයඹ පළාතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා තමා නමින් ලබා ගත් **ව.ප.ස.මු. 02** ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා ඉදිරිපත් කළ යුතුය. **ව.ප.ස.මු. 02** ආකෘතියේ ලදුපත හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබාගත් ලදුපත් හා මුදල් ඇණවුම් හෝ මුදල් කිසිවක් භාරගනු නොලබන අතර එවැනි ලදුපත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ට විභාගය සඳහා ඉදිරිපත් වීමට ඉඩ නොදෙන බව ද කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව ද එම විභාග ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩ දෙනු නොලබන බව ද සැලකිය යුතුය. **(මුදල් ගෙවූ ලදුපතේ ඡායාස්ථ පිටපතක් ළඟ තබා ගැනීම මතු ප්‍රයෝජනවත් විය හැක.)**

08. **අයදුම් කළ යුතු ක්‍රමය :-**

8.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කරගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026.04.27 වැනි දින හෝ එදිනට පෙර **"ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි, **"සැලසුම් ශිල්පී තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026 "** යනුවෙන් සඳහන් කළ යුතුය.

8.2 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හෝ නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හෝ ප්‍රමාද වී ලැබෙන හෝ අපැහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව විමසා බැලීම අයදුම්කරු සතු වගකීමකි. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරු විසින් ම දරා ගත යුතුය. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ. **(අයදුම්පත්‍රයේ ඡායාස්ථ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)**

8.3 අයදුම්පත් එවීමේදී අයදුම්පතේ සඳහන් කරනු ලබන අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකපත්‍රවල සහතික කළ පිටපත බැගින් අමුණා එවිය යුතු වේ.

8.4 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2026.04.27** වේ.

09. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :-**

අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 71,240/- කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

10. අයදුම්පත්‍රය පිරවීමේදී සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. එම තොරතුරු කිසිදු අයුරකින් සංශෝධනයට ඉඩදෙනු නොලැබේ. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවකු විභාගයට පෙනී සිටීමට නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ ඇය වයඹ පළාත් සභා රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවන.

11. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කර එවන ලද අයදුම්පත් පරීක්ෂාවට ලක් කර, මෙම බඳවාගැනීමේ නිවේදනයේ සඳහන් තනතුරු සඳහා අයදුම්කිරීමට සුදුසුකම්ලත් අයදුම්කරුවන් සඳහා පමණක්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලැබේ. ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ (www.psc.nw.gov.lk) නිල වෙබ් අඩවියේ නිවේදනයක් පළ කරනු ලැබේ. **විභාගය පැවැත්වෙන දිනට දින 03 කට පෙර විභාග ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් වහාම ඒ බව වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයට දැනුම් දිය යුතු ය.**

12. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශපත්‍රයක් ලැබීම අයදුම්කරු මෙම තනතුරෙහි පත්වීමක් ලැබීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ ලිපි ලේඛනවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය. සෑම අයදුම්කරුවෙක් ම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්යය වේ.

13. **අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :-**

අපේක්ෂකයෙකු තමා පෙනී සිටින සෑම විෂයයක් සඳහාම තම අනන්‍යතාවය පහත සඳහන් ලේඛනයකින් විභාග ශාලාධිපතිට තහවුරු කළ යුතුය. ;

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ;

*හෝ*

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය / වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව තහවුරු කරගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේම තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

*සටහන: විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපේක්ෂකයෙකු අපොහොසත් වුවහොත් ඔහු/ඇය විභාගයට පෙනී සිටීම සඳහා නුසුදුස්සකු ලෙස සලකනු ලැබේ.*

14. මෙම විභාගය පැවැත්වීම හෝ නොපැවැත්වීම හෝ කල් දැමීම පිළිබඳ හෝ පැවැත්වීමෙන් පසු තෝරාගැනීම් කිරීම හෝ නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විමසා වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවරයා විසින් තීරණය කරනු ලැබේ.

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**එන්. එම්. ජේ. ප්‍රනාන්දු,**
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2026 මාර්තු මස 19 වැනි දින,
වයඹ පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

ආදර්ශ අයදුම්පත්‍රය

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

***වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී (එක් අවුරුදු පුහුණු ශ්‍රේණිය) තනතුරු සඳහා ස්ථිර පදනමින් නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2026***

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය ( අදාළ කොටුවේ √ ලකුණ යොදන්න)

සිංහල : ☐ දෙමළ : ☐ ඉංග්‍රීසි : ☐

01. 1.1 මුලකුරු සමඟ නම (සිංහලෙන්/දෙමළෙන්) : ……………………………………………………………………
……………………………………………………………………………………… මයා/ මිය/ මෙනවිය

1.2 මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :Mr./Miss/Mrs./ ……………………………………………
………………………………………………………………………………………………………………

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :………………………………………………………………………
………………………………………………………………………………………… මයා/ මිය/ මෙනවිය

1.4 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : Mr./Miss/Mrs./…………………………………………………
………………………………………………………………………………………………………………

1.5 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

02. 2.1 ස්ථිර පදිංචි ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :………………………………………………………………
………………………………………………………………………………………………………………

2.2 ස්ථිර පදිංචි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :……………………………………………………………
………………………………………………………………………………………………………………

2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :………………………………………………
………………………………………………………………………………………………………………

2.4 දුරකථන අංකය :………………………………….. වට්ස්ඇප් අංකය :………………………………….

2.5 විද්‍යුත් තැපැල් ලිපිනය (e-mail) :-. ………………………………………………………………………

.

03. 3.1 ස්ත්‍රී/ පුරුෂ භාවය : ස්ත්‍රී : ☐ පුරුෂ : ☐

3.2 උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

3.3 2026.04.27 දිනට වයස : අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

04. 4.1 අයදුම්කරු පදිංචි පරිපාලන දිස්ත්‍රික්කය : ……………………………………....................…………….…..

4.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය: ……………………………………………............…………………

4.3 ග්‍රාම නිලධාරි කොට්ඨාසය: ………………………………….........……………………………….

4.4 2026.04.27 දිනට වයඹ පළාතේ ස්ථිර පදිංචිය: අවු. : …………. මාස :………… දින :……........…

5.0 ***අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :***

5.1 *අ.පො.ස (සාමාන්‍ය පෙළ) :*

විභාගයේ වර්ෂය :………………… මාසය :……………… විභාග අංකය :……………………………

| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1 | | | 6 | | |
| 2 | | | 7 | | |
| 3 | | | 8 | | |
| 4 | | | 9 | | |
| 5 | | | 10 | | |

5.2 *අ.පො.ස (උසස් පෙළ) :*

විභාගයේ වර්ෂය :……………… මාසය :………… විභාග අංකය :……………………

| | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

5.3 *වෘත්තීය සුදුසුකම් :*

| *ආයතනය* | *හැදෑරූ පාඨමාලාව* | *කාල සීමාව* | *සාමාර්ථය* | *සහතිකපත් අංකය හා දිනය* |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

6.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර:

6.1 ලදුපත් අංකය :……………………… මුදල :………………………… දිනය :…………………………..

මුදල් ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :……………………………………………………………….

| ලදුපත මෙහි අලවන්න. |
|---|

7.0 අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පත්‍රයේ ම විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ද, මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට ද මම එකඟ වෙමි.

(ආ) ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මෙම තනතුරට පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම් ලැබීමෙන් පසු සේවය අවසන් කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

………………….. ……………………………,
දිනය අයදුම්කරුගේ අත්සන.

8.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙහි අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු / සාමදාන විනිශ්චයකරුවකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයෙකු/ පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 71,240/- කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු හෝ අන්‍යාගමික පූජ්‍ය ස්ථානයක භාරකාරීත්වය දරන කෙනෙකු හෝ මගින් සහතික කරවා ගත යුතුය.

මෙම අයැදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................................................ මයා/මිය/මෙනවිය, මා පෞද්ගලිකව හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිටදී .......................... දින ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

අත්සන : ......................................................................
සහතික කරන අයගේ නම : ......................................................................
තනතුර හා නිල මුද්‍රාව : ......................................................................
දිනය : ......................................................................

03-1185/1

---

**වයඹ පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (ප්‍රමාණ සමීක්ෂක)
III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පහත සඳහන් තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා වයඹ පළාතේ ස්ථිර පදිංචි සුදුසුකම්ලත් ස්ත්‍රී / පුරුෂ දෙපාර්ශ්වයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

| *සංකේත අංකය* | *තනතුරු නාමය* | *බඳවා ගන්නා පදනම* |
|---|---|---|
| 01 | කාර්මික නිලධාරී (ප්‍රමාණ සමීක්ෂක) III ශ්‍රේණිය | ස්ථිර පදනමින් |
| 02 | කාර්මික නිලධාරී (ප්‍රමාණ සමීක්ෂක) එක් අවුරුදු පුහුණු ශ්‍රේණිය | එක් අවුරුදු පුහුණුවෙන් පසු ස්ථිර පදනමට |

*** ඉහත සංකේත අංක 01 සඳහා සුදුසුකම්ලත් ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක අංක 02 සඳහා අවස්ථාව හිමි වේ.*

මෙම විභාගය වයඹ පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2026 මැයි මස කුරුණෑගල නගරයේ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයකදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කෙරේ. මෙම විභාගය කල්දැමීමට හෝ අවලංගු කිරීමට වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

01. අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් :- ඉහත සඳහන් සියලු තනතුරු සඳහා,

(අ) අධ්‍යාපන සුදුසුකම් :

භෞතික විද්‍යාව හා ගණිතය යන විෂයයන් සහිතව ගණිතය විෂයය ධාරාවට අයත් විෂයයන් තුනකින් අ.පො.ස. (උසස් පෙළ) විභාගය එකවර සමත් වීම ;

*හෝ*

තාක්ෂණවේදය විෂයය ධාරාවේ ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණය සඳහා විද්‍යාව ඇතුළුව විෂයයන් තුනකින් අ.පො.ස. (උසස් පෙළ) විභාගය එකවර සමත් වීම ;

*සහ*

සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

*සැ.යු.- ඉහත අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව එක් එක් තනතුර සඳහා පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ද සම්පූර්ණ කර තිබිය යුතුය.*

(ආ) වෘත්තීය සුදුසුකම් :-

| *තනතුරු නාමය* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|
| කාර්මික නිලධාරී (ප්‍රමාණ සමීක්ෂක) III ශ්‍රේණිය | I. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන (මට්ටක්කුලිය, ලබ්බුදුව හෝ යාපනය) ජාතික උසස් ප්‍රමාණ සමීක්ෂණ ඩිප්ලෝමාව ;<br>*හෝ*<br>II. ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂණ ආයතනය මගින් පිරිනමනු ලබන ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ ජාතික උසස් ඩිප්ලෝමාව ;<br>*හෝ*<br>III. වෘත්තීය තාක්ෂණික විශ්වවිද්‍යාලයකට අනුබද්ධිත විශ්වවිද්‍යාල විද්‍යායතනය මගින් පිරිනමනු ලබන ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ ජාතික උසස් ඩිප්ලෝමාව ;<br>*හෝ*<br>IV. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම ;<br>*හෝ*<br>V. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |

| *තනතුරු නාමය* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|
| කාර්මික නිලධාරී<br>(ප්‍රමාණ සමීක්ෂක)<br>එක් අවුරුදු පුහුණු ශ්‍රේණිය | I. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරකට අදාළ ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හදාරා ජාතික තාක්ෂණ සහතික පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම ;<br><br>*හෝ*<br><br>II. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමානයැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |

*සැ.යු.- ඉහත සියලු අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් 2026.04.27 දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර සහතික ලබා තිබිය යුතුය.*

02. වෙනත් සුදුසුකම්:

2.1 අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු අතර විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

2.2 සෑම අපේක්ෂකයෙකුම වයඹ පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි විය යුතුය.

2.3 අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන විට වයඹ පළාත තුළ පූර්වාසන්න වසර 03 ක කාලයක්වත් ස්ථිර පදිංචිව සිටි අයෙකු බවට ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකයක් (DS 04 ග්‍රාම නිලධාරී සහතිකය) මගින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී පදිංචිය සනාථ කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට වයඹ පළාතේ ස්ථිර පදිංචිය පූර්වාසන්න වසර 03 කට වඩා අඩු අයදුම්කරුවන් ද තමන් පදිංචි කාල සීමාව DS 04 ග්‍රාම නිලධාරී සහතිකය මගින් තහවුරු කළ යුතුය.

2.4 අයදුම්කරු වයඹ පළාතේ ස්ථිර පදිංචිය ලබා තිබුණ ද අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට වයඹ පළාතේ ස්ථිර පදිංචිය පූර්වාසන්න වසර 03 කට වඩා අඩුවන අවස්ථාවකදී, අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වනවිට අයදුම්කරුගේ කලත්‍රයා හට වයඹ පළාතේ පූර්වාසන්න වසර 03 ක කාලයක් වත් ස්ථිර පදිංචිය තිබේ නම්, එවැනි අයදුම්කරුවන් පිළිබඳව ද ඉහත 2.3 වගන්තිය ප්‍රකාරව සලකා බැලේ. කලත්‍රයාගේ සහ අයදුම්කරුගේ පදිංචි සහතික (DS 04) හා විවාහ සහතිකය සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී ඉදිරිපත් කළ යුතුය.

2.5 අදාළ තනතුර සඳහා බඳවාගනු ලැබුවහොත් අවම වශයෙන් වසර 10 ක් වයඹ පළාත තුළ සේවය කළ යුතු වේ.

2.6 2026.04.27 දිනට වයස අවුරුදු 18 ට නො අඩු සහ අවුරුදු 40 ට නො වැඩි විය යුතුය.

2.7 තනතුරට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

***සංලක්ෂය** :- ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.*

03. වැටුප් පරිමාණය:-

3.1 කාර්මික නිලධාරී (ප්‍රමාණ සමීක්ෂක) III ශ්‍රේණිය

මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය 2025.01.01 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I හි MN 3 – 2025 අනුව,

**රු. 52,250 - 10x 800 - 11 x 1190 - 10 x 1320 - 10 x 1350 - රු.100,040/- වේ.**

(2027.01.01 දක්වා එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන III හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ)

3.2 කාර්මික නිලධාරී (ප්‍රමාණ සමීක්ෂක) එක් අවුරුදු පුහුණු ශ්‍රේණිය

රා.ප.ච. 10/2025 හි උපලේඛන අංක VI අනුව පුහුණු කිරීමේ ශ්‍රේණියට අදාළව මාසික දීමනාව රු.41, 317.00 කින් ආරම්භ වී ඉදිරියට ගෙවීම් කරනු ලබන අතර පුහුණු කාලය අවසානයේ III වන ශ්‍රේණියට පත්වීම් ලද පසු ඉහත 3.1 හි දක්වා ඇති MN 3 – 2025 ට අදාළ වැටුප් පරිමාණය අනුව වැටුප් ගෙවනු ලැබේ.

04. සේවා කොන්දේසි:

4.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තවද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

4.2 මෙම තනතුරට පත් කරනු ලබන්නන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, පරිවාස කාලය තුළ සිය තනතුරේ රාජකාරී වැඩ සහ හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවෙනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්ව තිබේ නම් හා සේවය ස්ථිර කිරීම සඳහා වන අනෙකුත් අවශ්‍යතාවන් සම්පූර්ණ කර තිබේ නම් පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කරනු ලැබේ.

4.3 රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළදී ලබා ගත යුතුය.

4.4 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට ආනුෂාංගික චක්‍රලේඛ අනුව සේවයට බැඳී වසර 03 ක් ඇතුළත සේවයට බැඳුණු භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙකුත් රාජ්‍ය භාෂාව/ භාෂා පිළිබඳ ප්‍රවීණතාවය නියමිත මට්ටමට ලබා ගත යුතුය.

4.5 III වන ශ්‍රේණියේ වසර 05 ක් ඉක්මවීමට පෙර ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අ.පො.ස. (සා.පෙළ) සම්මාන මට්ටමේ ප්‍රවීණතාවයක් ලබා ගත යුතුය.

4.6 මෙම තනතුර සඳහා වන බඳවා ගැනීමේ / උසස් කිරීමේ පරිපාටියේ රෙගුලාසි හා ඒ අනුව පැවරෙන කාර්යභාරයට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද වයඹ පළාත් කාර්ය පටිපාටික රීති, වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහයට හා විනය කාර්යය සංග්‍රහයට ද දෙපාර්තමේන්තු නියෝග වලට ද වයඹ පළාත් සභා තාක්ෂණ සේවයට අයත් කාර්මික නිලධාරී/සැලසුම් ශිල්පි තනතුරු සඳහා වන සේවා ව්‍යවස්ථාවට ද රාජ්‍ය හා වයඹ පළාත් සභාව විසින් නිකුත් කර ඇති හා වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසිවලට හා නියෝගවලට ද අනුකූලව ක්‍රියාකිරීමට සියලුම නිලධාරීන් බැඳී සිටී.

05. බඳවා ගැනීමේ ක්‍රමය:-

5.1 ලිඛිත තරග විභාගයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. විභාග විෂයය නිර්දේශයේ දැක්වෙන එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබා ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව ප්‍රමුඛතා ලේඛනයක් සකස් කරනු ලැබේ. ප්‍රමුඛතා ලේඛනයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ. අදාළ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ඇති අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු වූ විට එම අයට ලිඛිත විභාගයකින් තොරව සම්මුඛ පරීක්ෂණයකින් පමණක් බඳවා ගනු ලැබේ.

5.2 සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමක් සිදු නොකරන අතර අධ්‍යාපන, වෘත්තීය ඇතුළු මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා ශාරීරික යෝග්‍යතාව පරීක්ෂා කර බැලීම සිදු කරනු ලැබේ.

5.3 III වන ශ්‍රේණියට සෘජුව බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලැබූවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සිටින විට III වන ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

5.4 III වන ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලැබූවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක ඉතිරි පුරප්පාඩු සඳහා එක් අවුරුදු පුහුණු ශ්‍රේණියට බඳවා ගනු ලැබේ. එසේ බඳවා ගන්නා ලද අයදුම්කරුවන් එක් අවුරුදු පුහුණු කාල සීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පවත්වන විභාගය සමත් වීමෙන් පසු III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

*සටහන : ඉහත පුහුණු කාල සීමාව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත්වීමට අපොහොසත් වන ආධුනිකයන් වෙතොත් ඔවුනට මාස **06** කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගයෙන් අසමත් වන ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ලැබේ.*

06. **ලිඛිත විභාගය:**

6.1 ලිඛිත විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මාධ්‍යයකින් ඉල්ලුම් කළ හැකි අතර, ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

6.2 මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. සවිස්තරාත්මක විභාග විෂය නිර්දේශයන් පහත පරිදි වේ.

| *ප්‍රශ්නපත්‍රය* | *කාලය* | *මුලු ලකුණු* | *සමත් වීම සඳහා ලබා ගත යුතු ලකුණු* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 03 | 100 | 40% |

විභාග විෂයය නිර්දේශය :-

<u>බුද්ධි පරීක්ෂණය</u>

(01) අයදුම්කරුවන්ගේ භාෂා හැකියාව, ගණිතමය කුසලතාවය සහ තර්කන ශක්තිය මැන බැලීම සඳහා සකස් කරනු ලබන කෙටි හා බහුවරණ ශෛලියේ ප්‍රශ්න වලින් සමන්විත වේ.

(02) <u>විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය</u>

සම්මත ප්‍රමිතීන් (SLS 573) භාවිතා කරමින් ප්‍රමාණ පත්‍ර සැකසීම, තක්සේරු ශිල්ප ක්‍රම භාවිතයෙන් ඇස්තමේන්තුකරණය, කොන්ත්‍රාත් කොන්දේසි (CIDA/SBD) භාවිතය, ගෙවීම් ක්‍රියාවලිය සඳහා සාමූහික මිනුම් ලබා ගැනීම, අතුරු සහ අවසන් ගිණුම් පරීක්ෂා කිරීම, කොන්ත්‍රාත් විචලනය.

07. **විභාග ගාස්තු:**

විභාග ගාස්තු වශයෙන් රු.1,200/- ක මුදලක් වයඹ පළාත් සභාවේ අංක 2003-02-13 දරන ආදායම් ශීර්ෂයට බැරවන පරිදි වයඹ පළාතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා තමා නමින් ලබා ගත් **ව.ප.ස.මු.02** ලදුපත අයදුම්පත්‍ර යේ නියමිත ස්ථානයේ අලවා ඉදිරිපත් කළ යුතු ය. **ව.ප.ස.මු.02** ආකෘතියේ ලදුපත හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබාගත් ලදුපත් හා මුදල් ඇණවුම් හෝ මුදල් කිසිවක් භාරගනු නොලබන අතර එවැනි ලදුපත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ට විභාගය සඳහා ඉදිරිපත් වීමට ඉඩ නොදෙන බව ද කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව ද එම විභාග ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩ දෙනු නොලබන බව ද සැලකිය යුතුය. **(මුදල් ගෙවූ ලදුපතේ ඡායාස්ථ පිටපතක් ළඟ තබා ගැනීම මතු ප්‍රයෝජනවත් විය හැක.)**

08. **අයදුම් කළ යුතු ක්‍රමය:**

8.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කරගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2026.04.27** වැනි දින හෝ එදිනට ප්‍රථම **"ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි, **"ප්‍රමාණ සමීක්ෂක තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026 "** යනුවෙන් සඳහන් කළ යුතුය.

8.2 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හෝ නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හෝ ප්‍රමාද වී ලැබෙන හෝ අපැහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව විමසා බැලීම අයදුම්කරු සතු වගකීමකි. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරු විසින්ම දරා ගත යුතුය. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ. (අයදුම්පත්‍රයේ ඡායාස්ථ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

8.3 අයදුම්පත් එවීමේ දී අයදුම්පතේ සඳහන් කරනු ලබන අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වන සහතිකපත්‍ර වල සහතික කළ පිටපත බැගින් අමුණා එවිය යුතු වේ.

8.4 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය **2026.04.27** වේ.

09. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම:**

අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 71,240/- කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

10. ඉල්ලුම්පත්‍රය පිරවීමේ දී සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. එම තොරතුරු කිසිදු අයුරකින් සංශෝධනයට ඉඩදෙනු නොලැබේ. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවකු විභාගයට පෙනී සිටීමට නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ ඇය වයඹ පළාත් සභා රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවන.

11. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කර එවන ලද අයදුම්පත් පරීක්ෂාවට ලක් කර, මෙම බඳවා ගැනීමේ නිවේදනයේ සඳහන් තනතුරු සඳහා අයදුම්කිරීමට සුදුසුකම්ලත් අයදුම්කරුවන් සඳහා පමණක්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලැබේ. ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ (www.psc.nw.gov.lk) නිල වෙබ් අඩවියේ නිවේදනයක් පළකරනු ලැබේ. **විභාගය පැවැත්වෙන දිනට දින 03 කට පෙර විභාග ප්‍රවේශපත්‍රය නොලැබුණි නම්, වහාම වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයට දැනුම් දිය යුතුය.**

12. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශපත්‍රයක් ලැබීම අයදුම්කරු මෙම තනතුරෙහි පත්වීමක් ලැබීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ ලිපි ලේඛනවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය. සෑම අයදුම්කරුවෙක්ම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

13. **අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය:**

අපේක්ෂකයෙකු තමා පෙනී සිටින සෑම විෂයයක් සඳහාම තම අනන්‍යතාවය පහත සඳහන් ලේඛනයකින් විභාග ශාලාධිපතිට තහවුරු කළ යුතුය.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ;

*හෝ*

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය / වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව තහවුරු කරගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

***සටහන :** විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපේක්ෂකයෙකු අපොහොසත් වුවහොත් ඔහු/ඇය විභාගයට පෙනී සිටීම සඳහා නුසුදුස්සෙකු ලෙස සලකනු ලැබේ.*

14. මෙම විභාගය පැවැත්වීම හෝ නොපැවැත්වීම හෝ කල් දැමීම පිළිබඳ හෝ පැවැත්වීමෙන් පසු තෝරාගැනීම් කිරීම හෝ නොකිරීම හෝ, අයදුම්කරුවෙකු කුමන තනතුර සඳහා තෝරාගනු ලබන්නේ ද යන වග හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විමසා වයඹ පළාත් ගරු ආණ්ඩුකාරවරයා විසින් තීරණය කරනු ලැබේ.

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනය නිවැරදි සේ සළකා කටයුතු කරනු ලැබේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එන්. එම්. ජේ. ප්‍රනාන්දු
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2026 මාර්තු මස 19 දින,
වයඹ පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

*වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී ( එක් අවුරුදු පුහුණු ශ්‍රේණිය) තනතුරු සඳහා ස්ථිර පදනමින් නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026*

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය ( අදාළ කොටුවේ √ ලකුණ යොදන්න)

සිංහල : ☐ දෙමළ : ☐ ඉංග්‍රීසි : ☐

| *ඉල්ලුම් කරන තනතුර/ තනතුරු නාමය* | *සංකේත අංකය* |
|---|---|
| | |
| | |

01. 1.1 මුලකුරු සමඟ නම (සිංහලෙන්/දෙමළෙන්) : ……………………………………………………………

…………………………………………………………………………… මයා/ මිය/ මෙනවිය

1.2 මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :Mr./Miss/Mrs./ ……………………………………………

……………………………………………………………………………………………………

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :……………………………………………………………

…………………………………………………………………………… මයා/ මිය/ මෙනවිය

1.4 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : Mr./Miss/Mrs./…………………………………………

……………………………………………………………………………………………………

1.5 ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

02. 2.1 ස්ථිර පදිංචි ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :…………………………………………………………

……………………………………………………………………………………………………

2.2 ස්ථිර පදිංචි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :…………………………………………………

……………………………………………………………………………………………………

2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :…………………………………………

……………………………………………………………………………………………………

2.4 දූරකථන අංකය :………………………………….. වට්ස්ඇප් අංකය :……………………………………

2.5 විද්‍යුත් තැපැල් ලිපිනය (e-mail) :-. ……………………………………………………………

.

03. 3.1 ස්ත්‍රී/ පුරුෂ භාවය : ස්ත්‍රී : [ ] පුරුෂ : [ ]

3.2 උපන් දිනය : වර්ෂය : [ ][ ][ ][ ] මාසය : [ ][ ] දිනය : [ ][ ]

3.3 2026.04.27 දිනට වයස : අවුරුදු : [ ][ ] මාස : [ ][ ] දින : [ ][ ]

04. 4.1 අයදුම්කරු පදිංචි පරිපාලන දිස්ත්‍රික්කය : ……………………………………………………..

4.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය: ………………………………………………………………

4.3 ග්‍රාම නිලධාරී කොට්ඨාසය: ………………………………………………………………….

4.4 2026.04.27 දිනට වයඹ පළාතේ ස්ථිර පදිංචිය : අවු. : ………… මාස :………… දින :………...

5.0 **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :**

5.1 *අ.පො.ස (සාමාන්‍ය පෙළ) :*

විභාගයේ වර්ෂය :………………… මාසය :……………… විභාග අංකය :……………………………

| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1 | | | 6 | | |
| 2 | | | 7 | | |
| 3 | | | 8 | | |
| 4 | | | 9 | | |
| 5 | | | 10 | | |

5.2 අ.පො.ස (උසස් පෙළ) :

විභාගයේ වර්ෂය :……………… මාසය :………… විභාග අංකය :……………………

| | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

5.3 **වෘත්තීය සුදුසුකම් :**

| *ආයතනය* | *හැදෑරූ පාඨමාලාව* | *කාල සීමාව* | *සාමාර්ථය* | *සහතිකපත් අංකය හා දිනය* |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

6.0 **විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර:**

6.1 ලදුපත් අංකය :……………………… මුදල :………………………… දිනය :…………………………..

මුදල් ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :…………………………………………………………………….

| ලදුපත මෙහි අලවන්න. |
|---|

7.0 **අයදුම්කරුගේ සහතිකය :**

(අ) මෙම අයදුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ද, මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට ද මම එකඟ වෙමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මෙම තනතුරට පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම් ලැබීමෙන් පසු සේවය අවසන් කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

………………….. ……………………………,
දිනය අයදුම්කරුගේ අත්සන

8.0 **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙහි අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයකු / සාමදාන විනිශ්චයකරුවකු/ දිවුරුම් කොමසාරිස්වරයකු/ නීතිඥවරයකු/ ප්‍රසිද්ධ නොතාරිස් කෙනකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයකු/ පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 71,240/- කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනකු හෝ අන්‍යාගමික පූජ්‍ය ස්ථානයක භාරකාරීත්වය දරන කෙනකු හෝ මගින් සහතික කරවා ගත යුතු ය.

මෙම අයැදුම්පත ඉදිරිපත් කරනු ලබන .............................................................................. මයා/මිය/මෙනවිය, මා පෞද්ගලිකව හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ........................... දින ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

අත්සන : ........................................................................
සහතික කරන අයගේ නම : ........................................................................
තනතුර හා නිල මුද්‍රාව : ........................................................................
දිනය : ........................................................................

03-1185/2

---

**වයඹ පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආදායම් පරීක්ෂක III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

01. වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ආදායම් පරීක්ෂක III වන ශ්‍රේණියේ තනතුරුවල පවතින පුරප්පාඩු 40 ක් පිරවීම සඳහා වයඹ පළාත තුළ ස්ථිර පදිංචි, සුදුසුකම්ලත් ස්ත්‍රී / පුරුෂ දෙපාර්ශ්වයෙන්ම මාර්ගගතව අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම තරග විභාගය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2026 මැයි මස කුරුණෑගල හා පුත්තලම පිහිටි විභාග මධ්‍යස්ථානයන්හිදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කෙරේ. (පුත්තලම විභාග මධ්‍යස්ථානය සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොසිටියහොත් කුරුණෑගලදී පමණක් විභාගය පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.)

*සංලක්ෂය: යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.*

02. **වැටුප් ක්‍රමය :**

අංක 10/2025 හා 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව ආදායම් පරීක්ෂක තනතුරෙහි III, II, හා I වැනි ශ්‍රේණිවලට අදාළ මාසික වැටුප් පරිමාණය (MN-1 10/2025)

**රු. 45,230 - 10 x 630 - 11x840 x 10-1,190x10-රු. 76,360 ක් වන අතර, එම වැටුප ඔබට හිමි වන්නේ 2025.04.01 දින සිට වේ.**

03. **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :**

3.1 අධ්‍යාපන සුදුසුකම්:

(i) සිංහල/දෙමළ, ගණිතය සහ ඉංග්‍රීසි හා තවත් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත් වීම. (මින් විෂයයන් 05 ක් එකවරකදී සමත්ව තිබිය යුතුය) ;

*සහ*

(ii) අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී සියලුම විෂයයන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03 ක් සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

3.2 වෙනත් සුදුසුකම් :

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

(ii) අයදුම්කරු විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය.

(iii) අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් වයඹ පළාත් සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවකු විය යුතු අතර, ඡන්ද හිමි නාමලේඛනය හෝ ඡන්ද හිමි නාමලේඛනය අනුව ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන DS4 සහතිකයක් මගින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී ස්වකීය පදිංචිය සනාථ කළ යුතු ය.

(iv) සෑම අයදුම්කරුවකුම වයඹ පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

(v) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

*සැළකිය යුතුයි: දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු වූවන්ට ඉහත උපරිම වයස් සීමාව අදාළ නොවේ.*

04. **සේවා කොන්දේසි :**

4.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තවද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

4.2 මෙම තනතුරට පත් කරනු ලබන්නන් අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

4.3 මෙම තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියේ රෙගුලාසි වලට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රයේ රෙගුලාසි වලට ද මුදල් රෙගුලාසි වලට ද දෙපාර්තමේන්තු නියෝග වලට ද වයඹ පළාත් විනය කාර්ය සංග්‍රහයට ද පළාත් මූල්‍ය රීති සංග්‍රහයට ද වයඹ පළාත් ආදායම් පරීක්ෂක සේවයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියට ද රජය හා වයඹ පළාත් සභාව විසින් නිකුත් කර ඇති හා වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි වලට හා නියෝග වලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලුම නිලධාරීන් බැඳී සිටිය යුතු ය.

05. **බඳවා ගැනීමේ ක්‍රමය :**

5.1 පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා විභාග පරිපාටියේ දැක්වෙන එක් එක් ප්‍රශ්න පත්‍රයට වෙන් කර ඇති ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) ලබා ගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් 50% ක් ලබා ගත යුතු වේ.

5.2 ඉහත ආකාරයට පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව ප්‍රමුඛතා ලේඛනයක් සකස් කර, පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් මූලික සුදුසුකම් හා ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට කැඳවා බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

06. **විභාග පරිපාටිය :**

මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. මෙම විභාගය සඳහා සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මාධ්‍යයකින් ඉල්ලුම් කළ හැකි අතර, **ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.**

| | *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* |
|---|---|---|---|
| (i) | බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 |
| (ii) | භාෂා හැකියාව | පැය 01 | 100 |

(i) බුද්ධි පරීක්ෂණය :

අපේක්ෂකයා සතු සාමාන්‍ය බුද්ධිය, තර්කන හැකියාව, අදහස් ප්‍රකාශනය, සංඛ්‍යාත්මක කුසලතාව හා අවබෝධාත්මක හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි.

(ii) භාෂා හැකියාව :

අපේක්ෂකයා සතු අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ භාවිතය, නිරවුල් හා පැහැදිලි අදහස් ප්‍රකාශනය, භාෂාවේ යෙදුම් පිළිබඳ අවබෝධය, සාරාංශකරණය හා රචනාමය හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි.

07. **විභාග ගාස්තු :-**

විභාග ගාස්තු වශයෙන් රු.1,200/- ක මුදලක් වයඹ පළාත් සභාවේ අංක 2003-02-13 දරන ආදායම් ශීර්ෂයට බැරවන පරිදි වයඹ පළාතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා තමා නමින් ලබා ගත් **ව.ප.ස.මු.02 ලදුපත** අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා ඉදිරිපත් කළ යුතු ය. **ව.ප.ස.මු.02** ආකෘතියේ ලදුපත් හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබාගත් ලදුපත් හා මුදල් ඇණවුම් හෝ මුද්දර ගාස්තු කිසිවක් භාරගනු නොලබන අතර, එවැනි ලදුපත් ඉදිරිපත් කරන අයදුම්කරුවන්ට විභාගය සඳහා ඉදිරිපත් වීමට ඉඩ නොදෙන බව ද, කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව ද, එම විභාග ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩ දෙනු නොලබන බවද සැලකිය යුතු ය. (මුදල් ගෙවූ ලදුපතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.)

08. **අයදුම් කළ යුතු පිළිවෙල :**

8.1 මෙම බඳවාගැනීම සඳහා අයදුම්පත් කැඳවීම මාර්ගගත ක්‍රමය ඔස්සේ පමණක් සිදු කරනු ලැබේ. වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය (psc.nw.gov.lk) වෙත පිවිස මාර්ගගත අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුතුය. අනතුරුව, ඔබ විසින් මාර්ගගතව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය PDF ගොනුවක් ලෙස බාගත කර ගෙන එහි මුද්‍රිත පිටපතක් ද තැපැල් මගින් යොමු කළ යුතු ය.

8.2 මුදල් ගෙවූ ලදුපත අලවන ලද මාර්ගගත අයදුම්පත්‍රයේ මුද්‍රිත පිටපත 2026.04.30 දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි,

ලේකම්,<br>
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,<br>
පළාත් සභා කාර්යාල සංකීර්ණය,<br>
කුරුණෑගල.

යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ තැපැල් කුරියර් සේවාව මගින් එවිය යුතුයි. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ආදායම් පරීක්ෂක සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026"** යනුවෙන් සඳහන් කළ යුතු ය.

*සැලකිය යුතුයි: දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.*

09. මාර්ගගතව අයදුම්පත්‍ර භාරගන්නා අවසන් දිනය **2026.04.27** වේ.

10. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරු විසින්ම දරා ගත යුතුය. නියමිත දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී ප්‍රමාද වන හෝ නැතිවන අයදුම්පත් පිළිබඳව ද මෙම නිවේදනයේ සඳහන් කර ඇති ලිපිනයට හැර වෙනත් අය වෙත යොමු කෙරෙන අයදුම්පත් පිළිබඳව ද කරනු ලබන පැමිණිලි සලකා බලනු නොලැබේ. අයදුම්පත් ලැබුනු බව දන්වනු නොලැබේ. ( අයදුම්පත්‍රයේ මුද්‍රිත පිටපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

11. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම:**

අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයකු/ විශ්‍රාමික ආයතන ප්‍රධානියකු/ කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි තැන/ සාමදාන විනිශ්චයකරුවකු/ දිවුරුම් කොමසාරිස්වරයකු/ නීතිඥවරයකු/ ප්‍රසිද්ධ නොතාරිස් කෙනකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයකු/ පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 71,240/- කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනකු හෝ අන්‍යාගමික පූජා ස්ථානයක භාරකාරීත්වය දරන කෙනකු හෝ මගින් සහතික කරවා ගත යුතු ය.

12. **අයදුම්කරුගේ අනන්‍යතාවය:**

විභාග අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ :-

(i) ජාතික හැඳුනුම්පත ;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය ;
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය,

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව තහවුරු කරගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

*සටහන : විභාග ශාලාවේදී තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වුවහොත් ඔවුන් විභාගයට පෙනී සිටීම සඳහා නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.*

13. **සාවද්‍ය තොරතුරු සැපයීම සඳහා දඬුවම් :**

(i) මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවකදී වුව ද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකි ය.

(ii) අපේක්ෂකයකු විසින් කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේත් නැතිනම් යම් වැදගත් කරුණක් හෝ ඔහු/ ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහකරනු ලැබීමට යටත් වනු ඇත.

14. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත පරිදි විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත තොරතුරු සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද **මාර්ගගත අයදුම්පත් හා මුද්‍රිත පිටපත ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන්** වෙත වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ (www.psc.nw.gov.lk) නිවේදනයක් පළකරනු ලැබේ. තරග විභාගය පැවැත්වෙන දිනට දින 03 කට පෙර ප්‍රවේශ පත්‍රය නොලැබිණි නම් ඒ බව වහාම වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයට දැනුම් දිය යුතු ය.

15. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශපත්‍රයක් ලැබීම අයදුම්කරු මෙම තනතුරෙහි පත්වීමක් ලැබීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ ලිපි ලේඛනවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු ය. සෑම අයදුම්කරුවෙක්ම තනතුරට අදාළ සියළු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

16. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාළ කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන හෝ එම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති වෙනත් කිසියම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

17. මෙම විභාගය පැවැත්වීම, කල් දැමීම, අවලංගු කිරීම හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම / නොගැනීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු ය.

18. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සළකා කටයුතු කරනු ලැබේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එන්. එම්. ජේ. ප්‍රනාන්දු
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2026 මාර්තු මස 19 දින,
වයඹ පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

03-1185/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.